# අශෝක ශිලා ලේඛනවලින් අනාවරණය වන ආගමික ඉගැන්වීම්

එච්.එස්.එච්. සමරවිල

ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
samalihansi99@gmail.com

**මුඛ්‍ය පද** - අශෝකයන්, ශිලා ලේඛන, ත්‍රිපිටකය

## හැඳින්වීම

මෞර්ය අධිරාජ්‍යයක පාලකයකු වූ අශෝකගේ (ක්‍රි.පූ. 304-232) රාජාභිෂේකයෙන් අටවැනි වර්ෂයේ දී කාලිංග යුද්ධය සිදුවීම සමඟ ඇති වූ විනාශකාරී තත්ත්වය නිසා අශෝකයන් දැඩි චිත්ත සන්තාපයට පත් විය. ඒ වන තෙක් පවත්වාගෙන ආ ප්‍රතිපත්ති වෙනස් කරමින් නව මිනිසකු බවට පත් විය. අශෝකයන් සෙල් ලිපි පිහිටුවා ඒ මඟින් යහපත සමාජගත කරන්නට විය. මේ ශිලා ලේඛන මඟින් ආගමික ඉගැන්වීමක් ජනතාව වෙත ගෙන යාමට උත්සාහ කළ බවක් විවිධ විචාරකයෝ පෙන්වා දෙති. ඒ අනුව ඇතැම් පිරිසක් මේ ශිලා ලේඛන මඟින් බෞද්ධ ආගමික ඉගැන්වීම් නිරූපණය වන බව දක්වති. (සේනාධීර, ගුණපාල, 1949: 8) තවත් පිරිසක් සියලු ආගම්වල සාරය යැයි ද කියති. (සේනාධීර, ගුණපාල 1949:8) බැලූ බැල්මට වෙනත් ආගමික ඉගැන්වීම් ද තිබෙන ආකාරයක් දකින්නට ලැබේ. මෙම පර්යේෂණය මඟින් අශෝක ශිලා ලේඛන තුළින් කියා පෑමට උත්සාහ කර තිබෙන්නේ බෞද්ධ ආගමික ඉගැන්වීම් යන වග පෙන්වා දීම අරමුණයි. අශෝක ශිලා ලේඛන මඟින් කියැවෙන්නේ බෞද්ධ ආගමික ඉගැන්වීම ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි.

## ක්‍රමවේදය

අශෝක ශිලා ලේඛන සහිත ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍ර භාවිත කරමින් පර්යේෂණය සිදු කරන ලදි.

## සාකච්ඡාව

අශෝක අධිරාජ්‍යයා තම ජීවිත පරිවර්තනයට පසුව ශිලාලේඛන මාධ්‍ය කරගෙන තම ප්‍රතිපත්ති රාජ්‍යයේ ජනතාව වෙත ගෙන යාමට විය. එය අශෝක ධර්ම විජය නමින් හඳුන්වයි. ඒ අනුව පිහිට වූ ශිලා ලේඛන සමස්තයක් ලෙස සලකා බැලූ විට බෞද්ධ ආගමික ඉගැන්වීම් උපකාරී වූ බවක් දැකිය හැකි ය. අශෝකයන් විසින් පිහිටුවන ලද 1-4 ගිරි ලිපි සමූහයක් වශයෙන් ගත් විට ප්‍රාණඝාතය නොකිරීමට අනුබල දී ඇත. ඒ වනතෙක් බිලි පූජාවන්ට මරණ ලද සත්ත්වයින්ට පණ රැක ගැනීමට අවස්ථාවක් ලබා දුනි. ඒ බව ගිරිනාර් පව්වෙහි 1 ලිපියෙහි "ඉධ න කිංචි ජීවං අරභිත්වා ප්‍රජුහිතවයං" යනුවෙන් කිසිම සතෙකු මරා යාග නොපැවැත්විය යුතු යනුවෙන් තිබීමෙන් ද, ගිරිනාර් පව්වෙහි 3 ලිපියෙහි 'ප්‍රාණාත...සාදු අනාරභෝ" යනුවෙන් ද සඳහන් ව තිබීමෙන් පෙන්වා දිය හැකි ය. රජ මාලිගය තුළ පවා එය අනුගමනය කර ඇත. බෞද්ධ ඉගැන්වීම් හි එදිනෙදා පුහුණු කළ යුතු ලෙස ප්‍රාණඝාතය නොකිරීම පන්සිල් හි පවා දක්වා ඇත. ඒ කරුණට බෞද්ධ ඉගැන්වීම් හි දක්වා ඇති වැඩි අවධානය අශෝක ශිලා ලේඛන මඟින් ද වඩ වඩාත් දක්වා තිබීමෙන් බෞද්ධ ඉගැන්වීම් උපකාරී කරගන්නට ඇති බව පෙන්වා දිය හැක. "සබ්බේ තසන්ති දණ්ඩස්ස, සබ්බේ ජීවිතං පියං" ආදී වශයෙන් ජීවිතයක වටිනාකම වෙනත් දහමක නම් තිබේ ද යන්න සිතීමට පවා නොහැකි ය.

ගිරි ලිපි 11 ධර්ම දානයට සමාන දානයක් නැත. "නාසති ඒතාරිසං දානං සාරිසං ධම්මදාන" යනුවෙන් සඳහන්ව ඇත. බෞද්ධ ඉගැන්වීම් හි සබ්බ දානං ධම්ම දානං ජිනාති යනුවෙන් දක්වා ඇති ඉගැන්වීම ම ප්‍රායෝගිකව මෙසේ දක්වා තිබෙන ආකාරය හා ගැළපෙනවා ඇත. ඒ අනුව ධර්ම දානයට වැඩි වටිනාකමක් දුන් බෞද්ධ ඉගැන්වීම් මෙලෙස උපයෝගී

කරගන්නට ඇති බව පෙන්වා දිය හැකි ය. එසේම මවට පියාට සැලකීම, වැඩිහිටියන්ට සැලකීම, ඥාතීන්ට දයාබර බව, මහණ බමුණන්ට ගරු කිරීම, ශිලා ලේඛන මඟින් දක්වා ඇත. මේ සමස්ත කාරණය එකිනෙක ගත්ත ද බෞද්ධ ඉගැන්වීම්වලින් මනාව උකහා ගත හැකි ය. "මාතා පීතු උපට්ඨානං", "ඤාතකානඤ්ච සංගහො", "ගාරවො ච නිවාතො ච", "සමණානං ච දස්සනං", මංගල සූත්‍රයේ කරුණු හා මනාව ගැළපෙන ආකාරය පැහැදිලි ය. භික්ෂූන් වහන්සේලා සමඟ ආශ්‍රය කිරීමෙන් ද උපාසකයකු ව සිටීමෙන් ද ලැබූ බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රයෙන් මෙසේ ශිලා ලේඛන මඟින් ද ඉදිරිපත් කර ඇති බව පෙන්වා දිය හැක.

ත්‍රිපිටකය ගල් පුවරුවල ලියා ඇති පළමු අවස්ථාව ලෙස සූත්‍රයන් හි නම් සඳහන් කර තිබීමෙන් බෞද්ධ ඉගැන්වීම් හි ලද ආභාෂය බව වඩාත් තහවුරු කරගත හැකි ය. ඒ අනුව විනය සමුකස, අලියවස හෙවත් අරියවංශ, අනාගතභය, මුනිගාථා, උපතිස පසිනා, රාහුලෝවාද සූත්‍රය උපයෝගී කරගෙන ඇති බවත් පැහැදිලි ය. චතුරාර්ය සත්‍ය, පටිච්ච සමුප්පාදය, ත්‍රිලක්ෂණය ආදී ගැඹුරු ධර්ම කාරණාවන්ගෙන් ඉවත් ව ලෞකික ජීවිතයට ගැළපෙන ලෙස බෞද්ධ ඉගැන්වීම් මනා ව ශිලා ලේඛන මඟින් ඉදිරිපත් කර ඇති ආකාරය පැහැදිලි වනු ඇත. අශෝකයන් දොළොස්වන ලිපියේ අන්‍යය බමුණන්ට පවා දන් දීමට කියා ඇත. "පූජෙතයා තු ඒව පරපාසංඩා නේත තන ප්‍රකරන්ත" යනුවෙන් පර නිකායන් පිදිය යුතු ය, යනුවෙන් දක්වා ඇත. බෞද්ධ ඉගැන්වීම් හි කාලාම සූත්‍රයේ අන්‍යය මත ඉවසීම ගැන දැක්වූ ඉගැන්වීම් හා සමාන බව කිව හැකි ය. එසේම හත්වැනි ගිරි ලිපිය මඟින් අශෝක අධිරාජයා බුදු දහමට පමණක් නොව අනිත් ආගම් පවා ඉවසීම බුදු දහමෙහි ඇති ආගමික සහනශීලී ප්‍රතිපත්තියෙන් ලබා ඇති ආකාරය කිව හැකි ය.

ඇතැම් ශිලා ලේඛන කරුණු ජෛන දහමේ ලක්ෂණ සමඟ ද ගැළපෙන බවක් පෙන්වයි. පරම අවිහිංසාවාදය වැනි ලක්ෂණ ඒ සඳහා ගත හැකි ය. නමුත් සමස්තයක් ලෙස ගත් විට සියලු කාරණ බෞද්ධ ඉගැන්වීම් හා ගැළපෙන අවස්තා බොහෝ දැකිය හැකි ය. අශෝකයන් ශිලා ලේඛන පිහිටුවීමට පෙර කාලයේ භික්ෂූන් වහන්සේලා ඇසුරෙහි සිටි බවත් උපාසකයකු ව සිටි බවත් සඳහන් වනු ඇත. සුළු ගිරි ලිපි එකෙහි අවුරුදු දෙක හමාරකට වැඩි කාලයක් ගිහි බැතිමතෙකුව සිටි බව සඳහන් වීමෙන් බෞද්ධ ඉගැන්වීම් හා මනාව හික්මෙන්නට ඇති බවත් ඒ මඟින් තම ප්‍රතිපත්තිය ජනතාව වෙත ගෙන යාමට ගළපගන්නට ඇති බවත් කිව හැකි ය. තවත් අවස්ථාවක අධිරාජ්‍යයා ධර්මවිජය මාර්ගයෙන් ජයගැනීම මෙලොව හෝ පරලොව දෙක සඳහා ම වන බව කියයි. "යො ධම්ම විජයො සොහිද ලොකිකො පරලොකිකො" යනුවෙන් පරලොවක් ගැන සිතීමට පාලකයකු යොමු වීම පවා ගත්විට අධිරාජයා තුළ බෞද්ධ ඉගැන්වීම් හි ඇති ආභාසය මඟින් මෙසේ ශිලා ලේඛන මඟින් පවා දක්වන්නට ඇති බවයි. මෙහි වෙනත් ආගමික ඉගැන්වීම්වල ලක්ෂණ දැකිය හැකි අතර ම, සමස්තයක් ලෙස අශෝක අධිරාජ්‍යයා තමන්ගේ ශිලා ලේඛන මඟින් බෞද්ධ ආගමික ඉගැන්වීම් ලෞකික ජීවිතයට උපකාරී වන ඉගැන්වීම් ආකාරයට නිරූපණය කර ඇති බව පෙන්වා දිය හැකි ය.

අශෝක විසින් ශිලා ලේඛන මඟින් ඉදිරිපත් කළේ සියලු දහම් හි සාරය යි ද, ආදී මතවාද අතරින් අශෝක ශිලා ලේඛන මඟින් බෞද්ධ ඉගැන්වීම් ලෞකික ජීවිතයට ගැළපෙන ලෙස නිරූපණය වී ඇති බව පෙන්වා දිය හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**


සේනාධීර, ගුණපාල. (1949), ***අශෝක සිරිත***, එම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.

විතානපතිරණ, විමලසේන. (2016), ***දැහැමි අශෝක,*** සීමා සහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

සරණංකර, ගණේගම (69), ***බෞද්ධ මහාධිරාජ අශෝක හා සෙල් ලිපි***, මංගල මුද්‍රණාලය, ඩීන්ස් පාර, මරදාන.